# අපෝස්තලික දේව සභාව පැරිසිය

## THE APOSTOLIC CHURCH PARIS

www.apostolicchurch-paris.org

www.jeevanamaga.org

**ඔබ යාච්ඥා කරනවිට මෙම පොරොන්දු සමඟ යාච්ඥා කරන්න**

## අඳුනා ගැනීමේ කට්ටලය.

**මාව පිළිගෙන ඇත.** — එපීස 1:6

තමන්වහන්සේගේ කැමැත්තේ ප්‍රසන්නකමේ හැටියට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන පුත්‍රයන් වීමට අප පෙර නියමකළ සේක

**මාව ආලේප කර ඇත.** — 1යොහාන් 2:27

නුඹලා උන්වහන්සේගෙන් ලැබූ ආලේපය නුඹලා තුළ පවතින්නේය, යමෙකු විසින් නුඹලාට ඉගැන්වීම ඕනෑකරන්නේ නැත: එම ආලේපය සියල්ල ගැන නුඹලාට උගන්වන ලෙසද, එය බොරු නොව සත්‍යව තිබෙන ලෙසද, එයින් නුඹලාට ඉගැන්වූ ප්‍රකාරයටද උන්වහන්සේ තුළ පැවතියල්ලා.

**මම ආබ්‍රහම්ගේ බීජය වෙමි** — ගලාති 3:29

ඉදින් නුඹලා ක්‍රිස්තුස්වහන්සේගේ නම්, නුඹලා ආබ්‍රහම්ගේ වංශයද පොරොන්දුව ලෙස උරුමක්කාරයෝද වන්නහුය.

**මාව ඇතී දැඩි කර ඇත** — එපීස 1:6

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන පුත්‍රයන් වීමට අප පෙර නියමකළසේක

**මම අශීර්වාද ලද්දෙමී** — එපීස 1:4

සියලු ආත්මික ආශිර්වාද වලින් උන්වහන්සේ අපට ආශිර්වාද කළසේක.

**මම නැවත ඉපදී ඇත** — පේත්‍රැස් 1:23

මක්නිසාද නුඹලා කුණුවෙන්නාවූ බීජවලින් නොව දෙවියන්වහන්සේගේ ජීවමානවූ පවතින්නාවූ වචනය කරණකොටගෙන කුණු නොවෙන්නාවූ බීජවලින් නැවත උත්පාදකරනු ලැබූවහුය,

**මම නිර්භීතය** — එපීස 3:12

ක්‍රිස්තුස්වහන්සේ තුළ අපේ ඇදහිල්ල කරණකොටගෙන නිර්භීතකමත්, සැක නැතුව ළංවන්ට පුළුවන්කමත්, උන්වහන්සේ තුළ අපට තිබේ.

**මාව මිලදී ගෙන ඇත** — 1කොරින්ති 7:23

නුඹලා මිලේට ගන්නාලද්දහුය; මනුෂ්‍යයන්ගේ වාල්ලු නොවෙල්ලා.

**මම නොකැළැල්ව සිටිමි** — කොලොස්සි 1:22

නුඹලා ශුද්ධවූ නොකැළැල්වූ නිදොස්වූ තැනැත්තන් කොට තමන්වහන්සේ උදිරියෙහි ඔප්පුකරගන්න පිණිස, උන්වහන්සේගේ මාංසමයවූ ශරීරයෙහි මරණය කරණකොටගෙන සමගිකරගත්සේක.

**මාව වෙනස් කර ඇත** — 2 කොරින්ති 3:18

අපි සියල්ලෝම මුහුණ වැස්මක් නැතුව ස්වාමින්වහන්සේගේ තේජස කැඩපතකින් මෙන් දක්වමින්, ආත්මයාණන්වහන්සේ වන ස්වාමින්වහන්සේ කෙරෙන් තේජසින් තේජසට එම ස්වරූපයට වෙනස්කරනු ලබමුව.

**මට නියෝගයක් දී ඇත** — මතෙව් 28:19

එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බව්තිස්මකරපල්ලා.

**මම අතිශයින්ම ජය ලබා ඇත** — රෝම 8:37

නුඹලා අපට ප්‍රේමකළාවූ තැනැන්වහන්සේ කරණකොටගෙන අපි මේ සියල්ලේදී අතිශයින්ම ජය ගන්නෝ වමුව.

**මාව කැඳවා ඇත** — 1කොරින්ති 7:17

නුමුත් ස්වාමින්වහන්සේ එක් එක්කෙනාට බෙදාදුන් ප්‍රකාරයටද එක් එක්කෙනාව දෙවියන්වහන්සේ කැඳෙවූ ප්‍රකාරයටද හැසිරේවා. සියලු සභාවලදී මෙසේ නිෂ්ම කරමි.

**මම දේව දරුවෙකු වෙමි** ගලාති 3:26

මක්නිසාද නුඹලා සියල්ලෝම ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ඇදහිල්ල කරණකොටගෙන දෙවියන් වහන්සේගේ පුත්‍රයෝය.

**මාව තෝරා ගෙන ඇත** එපීස 1:4

ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළ අප තෝරාගත් ලෙසම, උන්වහන්සේ තුළ ස්වර්ගීය ස්ථානවල සියලු ආත්මික ආශිර්වාද වලින් උන්වහන්සේ අපට ආශිර්වාද කළසේක.

**මම පුරවැසියෙකු වෙමි** එපීස 2:19

ඒ නිසා නුඹලා තවත් විදේශියෝවත් ආගන්තුකයෝවත් නොව, ශුද්ධවන්තයන් සමග එක නුවර වැසියෝව දෙවියන් වහන්සේගේ පවුලේ අයවල්ව සිටින්නහුය.

**මම දක්ෂයකු වෙමි** පිලිප්පි 4:13

මා බලවත්කරනාවූ තැනැන්වහන්සේ තුළ මට සියලුදේ කරන්ට පුළුවන

**මාව කුරුසපත් කොට ඇත** ගලාති 2:20

මම ක්‍රිස්තුස්වහන්සේ සමග කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි, එසේවී නමුත් මම ජීවත් වෙමි නමුත් තවත් මා නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත්වනසේක.තවද මා දැන් මාංශයෙහි ජීවත්වන ජීවිතය මට ප්‍රේමකලාවූ, මා උදෙසා තමන්ම පාවාදුන්නාවූ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත්වෙමි.

**මම සම්පූර්ණය** කොලොස්සි 2:10

සියලු අධිපතිකමේද බලයේද හිස වන උන්වහන්සේ තුළ නුඹලා පූර්ණව සිටින්නහුය.

**මම පවිත්‍රය** යොහන් 15:3

මා විසින් නුඹලාට කී වචනය කරණ කොටගෙන නුඹලා දැන් පවිත්‍රය.

**මාව ගළවා ඇත** කොලොස්සි 1:13

පියාණන්වහන්සේ අන්ධකාරයේ බලයෙන් අප මුදා, තමන් ප්‍රේමයේ පුත්‍රයාණන්ගේ රාජ්‍යයට අප පමුණුවාගත් සේක.

**මම පාපයට මැරී ඇත** කොලොස්සි 3:3, රෝම 6:11

මක්නිසාද නුඹලා මළහුය, නුඹලාගේ ජීවනය ක්‍රිස්තුස්වහන්සේ සමග දෙවියන්වහන්සේ තුළ සඟවා තිබේ.

**මට සදාකාල ජීවණය ඇත** යොහන් 10:28

සදාකාල ජීවනය දෙමි; ඔව්හු කිසිකලකත් විනාශ නොවන්නෝය, කිසිවෙක් මාගේ අතින් ඔවුන් උදුරා නොගන්නේය.

**මට ඇදහිල්ල ඇත** රෝම 12:3

නුඹලා එකිනෙකා සුදුසු තරමට වඩා තම තමා ගැන උතුම් කොට නොසිතා, දෙවියන්වහන්සේ එකිනෙකාට බෙදාදුන් ඇදහිල්ලේ ප්‍රමාණය ලෙස පමණදැන සිතන හැටියට, මට දෙනලද අනුග්‍රහයෙන් නුඹලා අතරෙහි එකිනෙකාට කියමි

**මට සමාවදී ඇත** 1යොහාන් 2 : 12

මාගේ ප්‍රිය දරුවෙනි, නුඹලාට ලියා එවන්නේ උන්වහන්සේගේ නාමය නිසා නුඹලාගේ පව් කමාකරනු ලැබූ බැවින්ය.

**මම නිදහස්ය** රෝම 8: 2

මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළවූ ජීවනදායක ආත්මයාණන්වහන්සේගේ ව්‍යවස්ථාව පාපයේද මරණයේද ව්‍යවස්ථාවෙන් මා නිදහස් කළාය.

**මම පාපයෙන් නිදහස්ය** රෝම 6:22

නමුත් දැන් නුඹලා පාපයෙන් නිදහස් කරන ලදුව, දෙවියන්වහන්සේගේ දාසයෝවී, ශුද්ධකම සඳහා ඵල දරන්නහුය, එහි කෙළවරද සදාකාල ජීවනයය.

**මට අත්තිවාරමක් ඇත.** කොලොස් 2:7 1කොරින්ති 3:11

නුඹලාට ඉගැන්වූ ලෙසම නුඹලාගේ ඇදහිල්ලෙහි පිහිටා බොහෝසෙයින් ස්තුතිදෙමින් උන්වහන්සේ තුළ හැසිරියල්ලා.

**මට මහිමය ඇත** යොහන් 17:22

අප ඒකත්වයක්ව සිටින්නා සේම ඔවුනුත් ඒකත්වයක් වන පිණිස ඔබ මට දුන් මහිමය ඔවුන්ට දුනිමි

**මම සතුටුය** හිතෝපදේශය 10:28
ධර්මිෂ්ඨයන්ගේ ප්‍රාර්ථනාව ප්‍රීතියය; එහෙත් දුෂ්ටයන්ගේ බලාපොරොත්තුව සුන්වන්නේය.

**මට අනුග්‍රහය ඇත** 1කොරින්ති 1:4
ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ නුඹලාට දෙනලද දෙවියන්වහන්සේගේ අනුග්‍රහය නිසා මම නුඹලා ගැන මාගේ දෙවියන්වහන්සේට නිතරම ස්තුති කරමි.

**මම ශුද්ධය** එපිස 1:4
ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළ අප තෝරාගත් ලෙසම, උන්වහන්සේ තුළ ස්වර්ගීය ස්ථානවල සියලු ආත්මික ආශිර්වාද වලින් උන්වහන්සේ අපට ආශිර්වාද කළසේක.

**උන්වහන්සේගේ කර්මාන්තයය** එපිස 2:10
මක්නිසාද අපි වනාහි යහපත් ක්‍රියා කරන පිණිස ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ මවනු ලැබ දෙවියන් වහන්සේගේ කර්මාන්තයව සිටිමුව ඒ යහපත් ක්‍රියාවල අප හැසිරෙන පිණිස දෙවියන් වහන්සේ ඒවා කලින් සූදානම්කල සේක.

**මම උරුමක්කාරයෙකු වෙමි** රෝම 8:16,17
අපි දෙවියන්වහන්සේගේ දරුවෝයයි ආත්මයාණන්වහන්සේම අපේ ආත්මය එක්ව සාක්ෂිදෙනසේක. තවද දරුවෝ නම් උරුමක්කාරයෝය; දෙවියන්වහන්සේගේ උරුමක්කාරයෝය, ක්‍රිස්තුස්වහන්සේ හා සමග හවුල් උරුමක්කාරයෝය, උන්වහන්සේ හා සමග මහිමය ලබන පිණිස, උන්වහන්සේ සමග දුක්විඳුමු නම්, මෙසේ වන්නේය.

**මාව සුවකර ඇත** යෙසාය 53:5,1පේතෘස් 2:24
උන්වහන්සේ තුවාල ලැබුවේ අපේ අපරාධ නිසාය,පොඩිකරනු ලැබුවේ අපේ අයුතුකම් නිසාය.අපට සමාදානය ගෙනදෙන දඬුවම උන්වහන්සේ පිටට පැමුණුණේය; උන්වහන්සේගේ පහර වලින් අපට සුවය ලැබී තිබේ.

**මට උරුමය ඇත** එපිස 1:11
තමන්ගේ කැමැත්තේ මන්ත්‍රණය හැටියට සියල්ල සිද්ධකරන්නාවූ තැනැන්වහන්සේගේ නියමයේ ප්‍රකාරයට, අපි පෙර නියමකරනු ලැබ ක්‍රිස්තුස්වහන්සේ තුළ උරුමයක්වී සිටිමුව

**මට ප්‍රීතිය ඇත** යොහන් 15:11
මාගේ ප්‍රීතිය නුඹලා තුළෙහි පවතින පිණිසද නුඹලාගේ ප්‍රීතිය සම්පූර්ණ වන පිණිසද මේ දේවල් නුඹලාට කීවෙමි.

**මාව ආරක්ෂා කර ඇත** යූදස් 24
ඉතින් නුඹලා නොපැකිලෙන ලෙස ආරක්ෂාකරන්ටත් මහත් ප්‍රීතියෙන් යුක්තව උන්වහන්සේගේ තේජස ඉදිරියෙහි කැළැල් රහිතව තබන්ටත් සමර්ථවූ.

**මට ජීවනය ඇත** 1 යොහාන් 5:12
පුත්‍රයාණන් වහන්සේ ඇත්තාට ඒ ජීවනය ඇත; දෙවියන්වහන්සේගේ පුත්‍රයා නැත්තාට ඒ ජීවනය නැත.

**මට ප්‍රේම කර ඇත** 1 යොහාන් 4:10-11
එනම් අප දෙවියන්වහන්සේට ප්‍රේමකළා නොව උන්වහන්සේ අපට ප්‍රේමකොට, අපේ පව් උදෙසා ශාන්තිකර පූජාව වන පිණිස තමන්ගේ පුත්‍රයා එව් බවය. ප්‍රේමවන්තයෙනි දෙවියන්වහන්සේ අපට මෙසේ ප්‍රේමකළසේක් නම්, අප විසිනුත් එකිනෙකාට ප්‍රේමකළ යුතුය.

**මට නිදහස් කම ඇත** ගලාති 5:1
ක්‍රිස්තුස්වහන්සේ අප මුදාගත්තේ නිදහස්කම ඇතුව සිටිමටය එබැවින් දාසකම නැමති වියගහකට නැවත අසු නොවී ස්ථිරව සිටපල්ලා.

**මම ක්‍රිස්තුස් වැනිය** 1 යොහාන් 4:17
අප තුළ ප්‍රේමය සම්පූර්ණව තිබීම නම්, ඒ තැනැන්වහන්සේ සිටින ආකාරයටම අපත් මේ ලෝකයෙහි සිටින බැවින්, විනිශ්චය දවස ගැන නිසැකකම ඇතුව සිටීමය.

**මම අලුත් මැවිල්ලක්මි** 2 කොරින්ති 5:17
එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අළුත් මැවිල්ලක්ය. පරණදේ පහව ගියේය; මෙන්න, සියල්ලම අලුත් වී තිබේ.

**මම නිදොස්ය** රෝම 4:25
උන්වහන්සේ වනාහි අපේ වරද නිසා පාවාදෙනු ලැබ, අප ධර්මිෂ්ඨ කොට ගණන්ගනු ලැබීම සඳහා නැගුටුවනු ලැබුසේක.

**මම උන්වහන්සේගේ ශරීරයේ කොටසක් වෙමි 1 කොරින්ති 12:27**

ඉදින් නුඹලා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයද වෙන් වෙන් වශයෙන් එහි අවයවයෝද වෙති.

**මට සමාදානය ඇත යොහාන් 14:27**

නුඹලා වෙත සමාදානය තබායමි, මාගේ සමාදානය නුඹලාට දෙමි මා දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොව. නුඹලාගේ සිත් කැලඹෙන්ටවත් භයවෙන්ටවත් නොදෙල්ලා

**මට බලය ඇත ලූක් 10:19**

බලව සර්පයන්ද ගෝනුස්සන්ද පාගන්ටත් සතුරාගේ සතුරාගේ මුළු ශක්තිය මැඩපවත්වන්ටත් මා විසින් නුඹලාට බලයදී තිබේ.කොයි දෙයකින්වත් නුඹලාට අන්තරායක් නොවන්නේය.

**මාව ප්‍රාණවත් කර ඇත එපීස 2:5**

අපගේ වරද කරණකොටගෙන අප මැරී සිටි කල්හි පවා, ක්‍රිස්තුස්වහන්සේ සමග අප ජීවත්කර නුඹලා ගැලවී සිටින්නේ අනුග්‍රහයෙන්ය උන්වහන්සේ සමග අප නැගිටුවා.

**මම රාජකීය පූජකයෙක් වෙමි 1පේතෘස් 2 : 9**

නමුත් අන්ධකාරයෙන් තමන්ගේ විශ්මපත් ආලෝකයට නුඹලා කැඳවාගත් තැනන්වහන්සේගේ උත්කෘෂ්ටතාවන් දක්වන පිණිස නුඹලා වනාහි තෝරාගත් වංශයක්ද රාජකීය පූජකයෝද ශුද්ධවූ ජාතියක්ද දෙවියන් වහන්සේ සන්තක සෙනගක්ද වන්නහුය.

**මාව මුදා ඇත එළිදරව් 5:9**

ඔව්හු අලුත් ගීතිකාවක් ගායනාකරමින්: ඔබ පොත ගන්ටත් එහි මුද්‍රා කඩන්ටත් වටිනා තැනැන්වහන්සේය. මක්නිසාද ඔබ මරනු ලැබ, සියලු ගොත්‍රවලින්ද භාෂාවන්ගෙන්ද සෙනගගෙන්ද ජාතින්ගෙන්ද මිනිසුන් ඔබගේ ලෙයින් දෙවියන්වහන්සේට මිලේට ගෙන,

**මම ධර්මිෂ්ඨය 2 කොරින්ති 5 :21**

අප උන්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨ කම වන පිණිස පාපයක් නොදත්තාවූ උන්වහන්සේ අප වෙනුවට පාපය වෙන්ට සැලැස්සූ සේක.

**මට හික්මුනු මනසක් ඇත 2 තිමෝති 1:7**

මක්නිසාද දෙවියන්වහන්සේ අපට දුන්නේ බයාදුකමේ ආත්මයක් නොව බලයෙත් ප්‍රේමයෙත් හික්මවීමෙත් ආත්මයක්ය.

**මම ශක්තිමත්ය කොලොස්සි 1:11**

ප්‍රීතිය ඇතිව සියලු ආකාර ස්ථිරකමටත් ඉවසිලිවන්තකමටත් උන්වහන්සේගේ තේජසේ පරාක්‍රමයේ හැටියට සියලු ආකාර බලයෙන් ශක්තිමත් වෙමින්ද.

**මාව පිරිසිදු කොට ඇත 1 කොරින්ති 1:2**

ක්‍රිස්තුස් යේසුස්වහන්සේ කෙරෙහි පිරිසිදුකරනලද්දාවූ, ශුද්ධවන්තව සිටිමට කැඳවනලද්දාවූ කොරින්තියෙහි තිබෙන දෙවියන්වහන්සේගේ සභාවටද ඔවුන්ගෙත් අපගෙත් ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් සියලු තැන්වල යාච්ඤා කරන්නාවූ සියල්ලන්ටද

**මාව මාද්‍රා කර ඇත එපීස 1:13**

උන්වහන්සේ තුළ නුඹලාත් නුඹලාගේ ගැලවීමේ ශුභාරංචිය වන සැබෑවේ වචනය අසා, උන්වහන්සේ කෙරෙහි අදහාගෙන, උන්වහන්සේගේ මහිමයේ ප්‍රශංසාව සඳහා දෙවියන්වහන්සේට හිමිවූ වස්තුවේ මිදීම පිණිස,

**මම දේව පුත්‍රයෙකු වෙමි 1 යොහාන් 3:2**

ප්‍රේමවන්තයෙනි, දැන් අපි දෙවියන් වහන්සේගේ දරුවෝය, අපි කොයි ආකාර අය වන්නෙමුදැයි තවම ප්‍රකාශවී නැත. උන්වහන්සේ ප්‍රකාශවුණාම අපි උන්වහන්සේට සමානවන බව දනිමුව; මක්නිසාද උන්වහන්සේ සිටින ආකාරයටම අපි උන්වහන්සේ දකින්නෙමුව.

**මම යේසුස් සමග වාඩිවී සිටිමි එපීස 2: 6**

ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ස්වර්ගීයවූ ස්ථානවල උන්වහන්සේ සමග අප හිඳවූ සේක.

**මම දේව මාළිගාව වෙමි 2 කොරින්ති 6:16**

දේවතා රූප සමග දෙවියන්වහන්සේගේ මාළිගාවට ඇති එකගකම මොකද ? මක්නිසාද අපි ජීවමාන දෙවියන්වහන්සේගේ මාළිගාවය; එසේම දෙවියන්වහන්සේ කථා කොට; මම ඔවුන් අතරේ

වාසයකරන්නෙමි,හැසිරෙන්නෙමි: මම ඔවුන්ගේ දෙවියන්වහන්සේව සිටින්නෙමි, ඔව්හු ද මාගේ සෙනගව සිටින්නෝයයි කීසේක.

**<u>මාව විශිෂ්ඨව ජයට පමුණුවා ඇත</u>** **2 කොරින්ති 2 : 14**

තවද ක්‍රිස්තුස්වහන්සේ තුළ නිතරම අප ජයට පමුණුවන්නාවූ සියලු තැන්වල අපලවා උන්වහන්සේව දැනගැනීම නැමති සුවඳ පතුරුවන්නාවූ දෙවියන්වහන්සේට ස්තුතිවේවා.

**<u>මට ප්‍රඥාව ඇත</u>** **1 කොරින්ති 1 : 30**

නුමුත් උන්වහන්සේ කරනකොටගෙන නුඹලා ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ සිටින්නහුය. ඒ තැනැන්වහන්සේ දෙවියන් වහන්සේගෙන් අපට ප්‍රඥාව එනම් ධර්මිෂ්ඨකමද ශුද්ධකමද මිදීමද කරනු ලැබුසේක.

**<u>මම ජය ලබා ඇත</u>** **1 කොරින්ති 15:57**

නුමුත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන අපට ජය දෙන්නාවූ දෙවියන්වහන්සේට ස්තුතිවේවා.

© Copyright www.jeevanamaga.org 2007